මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023 ජනවාරි මස 04 වන දින |

## 2023 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති

නිදහසින් පසු උද්ගත වූ වඩාත්ම අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් කෙරෙහි ශ්‍රී ලංකාව 2022 වසරේදී මුහුණ දුන්නේය. 2019 වසරේදී පාස්කු ඉරිදා දින සිදු වූ ප්‍රහාර, 2020 වසරේදී කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම සහ එමගින් 2021 වසරේදී ද ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සිදු වූ බලපෑම, අහිතකර ගෙවුම් ශේෂ පීඩන මධ්‍යයේ 2022 වසරේදී සිදු වූ සමාජ, ආර්ථික හා දේශපාලන අර්බුදය මෙන්ම පෙර නොවූ පරිදි ප්‍රතිපත්ති වෙනස්කිරීම් මගින් වූ බලපෑම ඇතුළු මෑත වසරවලදී පැවති අඛණ්ඩ ආර්ථික අභියෝග මගින් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට අපේක්ෂා නොකළ අන්දමේ දුෂ්කරතා ඇති කරමින් ආර්ථික ක්‍රියාකාරකම්වලට දැඩි බලපෑමක් සිදු කරන ලදී. පුද්ගලයින්ගේ ජීවනෝපායන් අහිමි වූ අතර මූර්ත ආදායම බොහෝසෙයින් පහළ ගියේය. මෙම ආර්ථික අභියෝග මෙන්ම කාලානුරූපී නොවන ප්‍රතිපත්තිමය තීරණ මගින් දශක ගණනාවක් මුළුල්ලේ ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍ර තුළ පැවති ව්‍යුහාත්මක ගැටලු තවදුරටත් උග්‍ර කළ අතර, එමගින් සාර්ව ආර්ථික සමතුලිතතාවය බිඳ වැටීම හේතුවෙන් රටෙහි විවිධ අංශවල පසුබෑමක් ශීඝ්‍රයෙන් ඇති විය.

සාර්ව ආර්ථික ස්ථායීතාව නැවත ස්ථාපිත කිරීම අරමුණු කරගත් අසීරු, එහෙත් නොවැළැක්විය හැකි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2022 වසර තුළ ක්‍රියාත්මක කිරීමට රජයට සහ මහ බැංකුවට සිදු විය. උද්ධමන පීඩන අයහපත් වීම වැළැක්වීමට සහ කෙටි හා මැදි කාලීනව අහිතකර උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සඳහා පොලී අනුපාතික පෙර නොවූ අන්දමින් ඉහළ නංවමින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කරන ලදී. දැඩි විදේශ විනිමය හිඟය මධ්‍යයේ තෝරාගත් විදේශීය ණය නැවත ගෙවීම තාවකාලිකව අත්හිටුවන බව නිවේදනය කරන ලද අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකමෙහි අපේක්ෂිත සහාය ඇතිව රාජ්‍ය ණය ඒකාබද්ධ කිරීමට ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. වර්ධනය වෙමින් පැවති ගෙවුම් ශේෂ පීඩන පාලනය කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම සඳහා ඇතැම් ණය සේවාකරණ අත්හිටුවීම හේතුවෙන් රඳවාගත් විදේශ විනිමය මෙන්ම මිත්‍ර රටවලින් සහ බහුපාර්ශ්වික මූලාශ්‍රවලින් ලද විදේශ විනිමය ලැබීම් උපකාරී විය. අත්‍යවශ්‍ය ආනයන සඳහා ප්‍රමුඛත්වය ලබා දීම ඇතුළු තවත් ක්‍රියාමාර්ග කිහිපයක් මගින් විදේශ විනිමය මෙරටින් ගලායෑම තවදුරටත් පාලනය කරන ලදී. මෙම ක්‍රියාමාර්ග මගින් ඉන්ධන, ගල් අඟුරු, ගෑස්, ඖෂධ, සහ ආහාර ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍ය ආනයන සඳහා විදේශ විනිමය ලබා ගැනීම සහතික කළ අතර, එමගින් සමාජ ආර්ථික නොසන්සුන්තාවය බොහෝදුරට සමනය විය. මේ අතර, 2022 වසරේ මුල් කාලයේදී විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමෙන් අනතුරුව, වෙළඳපොළ සහභාගීවන්නන් සමග උපදේශන ක්‍රියාවලියක් සිදු කිරීම මගින් විනිමය අනුපාතිකයේ ස්ථායීතාව නැවත ස්ථාපනය කරන ලදී. විදේශ විනිමය රට තුළට ගෙන්වා ගැනීම සහ එම මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ අවශ්‍යතා සමග දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විදේශ විනිමය ද්‍රවශීලතාව ඉහළ නැංවීම සඳහා

වැඩිදුර ක්‍රියාමාර්ග ආරම්භ කරන ලද අතර, එමගින් අවිධිමත් වෙළඳපොළ ක්‍රියාකාරකම් අධෛර්යමත් කළේය. මේ අතර, මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් ගනු ලැබූ අතර, එමගින් සමස්ත සමාජ ආර්ථික ව්‍යුහය මත ඇති විය හැකි දිගුකාලීන බලපෑම් වළක්වාගත හැකි විය. තවද, ආර්ථිකය තිරසාර අන්දමින් යථා තත්ත්වයට පත් වීම සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වන රාජ්‍ය මූල්‍ය කටයුතුවල මෙන්ම ආර්ථිකයේ අනෙකුත් අංශවල ව්‍යුහාත්මක දුර්වලතා නිවැරදි කිරීම සඳහා රජය දිගුකාලීන ප්‍රතිසංස්කරණ සිදු කිරීම ආරම්භ කර ඇත.

කෙටි කාලීන ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට සමගාමීව, විස්තීරණ ණය පහසුකම් වැඩසටහනක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සාකච්ඡා රජය විසින් ආරම්භ කරන ලද අතර, 2022 සැප්තැම්බර් මාසයේදී නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළඹුණි. මේ අතර, මැදි කාලීන රාජ්‍ය ණය තිරසාරභාවය සහතික කිරීම අරමුණු කරගත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා නිල ණය හිමියන්ගෙන් මූල්‍යකරණ සහතික ලබා ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. ශ්‍රී ලංකාවේ ණය හිමියන් සමග සිදු කළ සාකච්ඡා සම්බන්ධව දැනට ලබා ඇති සැලකිය යුතු ප්‍රගතියත් සමග ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ලබා දෙන පහසුකම 2023 වසරේ මුල් කාලයේදී ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ දක්වා පෙර නොවූ ආකාරයේ කෙටි කාලීන ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත. මෙම දුෂ්කර කාලයේදී පුද්ගලයන් සහ ව්‍යාපාර විසින් සිදු කරන ලද කැපකිරීම් අර්ථවත් වනුයේ මැදි කාලීන හා දිගු කාලීන වශයෙන් ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් කළ විට පමණි. ඒ සඳහා, ආර්ථිකය තිරසාර අන්දමින් යථා තත්ත්වයට පත් කිරීම සහතික කිරීමට සමාජයේ සෑම පුද්ගලයෙකුගේම සහ සෑම අංශයකම සාමූහික හා ඒකාබද්ධ ප්‍රයත්න අවශ්‍ය වේ.

2023 වසර සහ ඉදිරිය සඳහා ආර්ථිකය පිළිබඳ ඉදිරි දැක්ම සහ සාර්ව ආර්ථික ස්ථායීතාව නැවත ලබා ගැනීම සඳහා වන මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ ප්‍රධාන අපේක්ෂා පහත පරිදි වේ:

## උද්ධමනය සහ ආර්ථික වර්ධනය

i. *2022 වසරේ මුල් භාගයේදී ශීඝ්‍රයෙන් ඉහළ ගිය උද්ධමනය, උද්ධමන පීඩන පාලනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න සහ රජයේ සැපයුම් අංශයේ ප්‍රතිපත්ති මෙන්ම ගෝලීය වශයෙන් මිල පීඩන සාපේක්ෂව අඩු වීම වැනි කරුණු හේතුවෙන් 2022 ඔක්තෝබර් මාසයේ සිට පහළ ගියේය.*

ii. *උද්ධමනය අඛණ්ඩව පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව සිදු වෙමින් මතුපිට උද්ධමනය 2023 වසරේ පළමු භාගයේදී පහළ ගොස් 2023 වසර අවසානය වන විට අපේක්ෂිත උද්ධමන මට්ටමට ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. උද්ධමනය ඉදිරි කාලය තුළ ඉහළ යාමේ යම් අවදානමක් මතු වුවහොත්, එය සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් පාලනය කරනු ඇත.*

iii. *අපේක්ෂිත උද්ධමනය අඛණ්ඩව පහළ යෑමේ ප්‍රවණතාව තුළ උද්ධමන අපේක්ෂා මනා ලෙස පාලනය වී පවතී.*

iv. ශ්‍රී ලංකා ආර්ථිකය 2022 වසරේදී සියයට 8.0කින් පමණ මූර්ත වශයෙන් සංකෝචනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, 2023 වසරේ දෙවන භාගයේ සිට ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වී ඉන් ඉදිරියට වර්ධන වේගය අඛණ්ඩව පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## මුදල් ප්‍රතිපත්තිය සහ පොලී අනුපාතික

i. මුදල් ප්‍රතිපත්තිය මගින් මැදි කාලීනව මිල ස්ථායීතාව සහතික කිරීම සඳහා අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත.

ii. ඉදිරියේදී බලාත්මක කිරීමට නියමිත මහ බැංකු පනතෙහි කෙටුම්පත සඳහා දැනටමත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මෙම පනත මගින් මහ බැංකුවේ ස්වාධීනත්වය සහ වගවීම තවදුරටත් ශක්තිමත් කරනු ඇති අතර එමගින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ මිල ස්ථායීතාව සහතික කිරීම යන මහ බැංකුවේ මූලික අරමුණ ශක්තිමත් කරනු ඇත.

iii. ආර්ථිකයේ ඉදිරි දැක්ම පිළිබඳව මහජනතාව මනා ලෙස දැනුම්වත් කිරීම සඳහා මහ බැංකුව ඉදිරි දැක්මක් සහිත ''මුදල් ප්‍රතිපත්ති වාර්තාවක්'' ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරනු ඇති අතර, එමගින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල විනිවිදභාවය තවදුරටත් වැඩිදියුණු කරනු ඇත.

iv. මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව වැඩිදියුණු වීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ ඉහළ අවදානම් පාලනය වීම හේතුවෙන් වර්තමානයේදී දක්නට ලැබෙන ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික ඉදිරි කාලය තුළදී අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

v. කෙටි කාලීන උද්ධමන ඉදිරි දැක්ම මගින් පෙන්වාදෙනු ලබන පරිදි, වෙළඳපොළ පොලී අනුපාතික ඉදිරියේදී පහළ යා හැකිය. එනමුත්, උද්ධමන පීඩන සැලකිය යුතු ලෙස පාලනය වන තෙක් මුදල් තත්ත්වයන් අවශ්‍ය පරිදි දැඩිව පවතී.

vi. මූල්‍ය ආයතන අතර තැන්පතු රැස් කිරීම සඳහා පැවති දැඩි තරගකාරීත්වය හේතුවෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල ගැළපීම් අභිබවා වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ ගොස් ඇති බැවින්, එවැනි අහිතකර තරගකාරීත්වයන් වළක්වා ගන්නා ලෙස මහ බැංකුව දැනටමත් බැංකු සහ බැංකු නොවන ආයතනවලින් ඉල්ලා ඇත. මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවයෙහි සිදුවන වැඩිදියුණු වීමත් සමග ඉදිරි කාලයේදී වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහයේ (තැන්පතු සහ ණය පොලී අනුපාතික) පහළ යෑමක් අපේක්ෂා කෙරේ. එහෙත්, එවැනි පහළ යෑමක් සිදුවීම සඳහා අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත වන්නේ නම් මහ බැංකුව සුදුසු පරිදි නියාමන ක්‍රියාමාර්ග ගැනීමට සලකා බලනු ඇත.

vii. ආර්ථිකයේ තරගකාරිත්වය වැඩි කිරීමට උපකාරී වන මැදි හා දිගු කාලීන සමතුලිතතා මට්ටම්වලට අනුකූලව විනිමය අනුපාතිකය තීරණය කිරීමේදී නම්‍යශීලීභාවය තවදුරටත් ස්ථාපනය කෙරේ.

## මූල්‍ය අංශය

*i.* *මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කිරීම මහ බැංකුවේ ප්‍රතිසංස්කරණ සහ ස්ථායීකරණ සැලැස්මේ ඉදිරියෙන්ම පවතින තවත් ප්‍රධාන අරමුණක් වේ.*

*ii.* *මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා බැංකුවල මුදල් ප්‍රවාහ අවශ්‍යතා සපුරාලීමට මහ බැංකුව විසින් ද්‍රවශීලතා සහාය ලබා දීම සහතික කරනු ලබයි.*

*iii.* *යෝජිත බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් බැංකු පද්ධතිය ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇති බව සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව සපයනු ඇති බවට අපේක්ෂා කරන අතර, එහි නිරාකරණ රාමුව වැඩිදියුණු කිරීම, තැන්පත්කරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ මහ බැංකුවේ නියාමන බලතල ශක්තිමත් කිරීම සිදු කරනු ඇත.*

*iv.* *ඉදිරියේදී ඇති විය හැකි අවදානම්වලට මුහුණදීම සඳහා බැංකු අංශයේ ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම් ආරක්ෂා කර ගැනීමට ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව සම්බන්ධයෙන් දැනට පවතින නියාමන සමාලෝචනය කෙරේ. තවද, රජය සහ බැංකු අතර පවතින ණය සම්බන්ධතාව සීමා කිරීම සඳහා තනි ණය ගැණුම්කරුවකු කෙරෙහි වන නිරාවරණ සීමා පිළිබඳ දැනට පවතින නියාමන සමාලෝචනය කරනු ඇත.*

*v.* *පරිමාණානුකූල පිරිමැසුම් ඇති කිරීම, සහයෝගීතාව සහ කාර්යක්ෂම බව වැඩිදියුණුවීම මගින් ලැබෙන ප්‍රතිලාභ සමග ප්‍රාග්ධනය ඉහළ දැමීම මෙන්ම මූල්‍ය ආයතනවල මූල්‍ය ශක්තිය, ඔරොත්තු දීමේ හැකියාව හා සමස්ත ස්ථායීතාව සහ ඉදිරි කාල සීමාව තුළ ව්‍යාපාරික ප්‍රජාවේ වර්ධනය වන ඉල්ලීම් සපුරාලීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා බැංකු සහ බැංකු නොවන මූල්‍ය අංශවල මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සිදු කිරීම/පහසුකම් සැපයීම සිදු වනු ඇත.*

*vi.* *බැංකු නොවන මූල්‍ය අංශයේ ස්ථායීතාව සහතික කිරීම අරමුණු කරගනිමින් වෙළඳපොළ ප්‍රවණතාවලට අනුකූලව 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත සඳහා සංශෝධන හඳුන්වා දෙනු ලැබේ. තවද, යෝජිත ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත මගින් සමස්ත බැංකු නොවන අංශයේ ගනුදෙනුකරුවන්ගේ වෙළඳපොළ හැසිරීම සහ පාරිභෝගික ආරක්ෂාව වැඩිදියුණු කරනු ඇත. තවද, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සහ නියාමනය නොකළ මුදල් ණයට දෙන පුද්ගලයින් නියාමනය යටතට ගෙන ඒම සඳහා වන ක්‍රියාමාර්ග සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.*

## විදේශ විනිමය කළමනාකරණය

*i.* *විදේශීය අංශයේ දත්ත ආවරණය ඉහළ නැංවීමට, නියාමන අධීක්ෂණය වැඩිදියුණු කිරීමට සහ දැනුම්වත් තීරණ ගැනීමට සහාය වීම සඳහා 2022 වසරේදී හඳුන්වා දුන් ජාත්‍යන්තර ගනුදෙනු සහ දේශීය විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණ පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කරනු ඇත.*

*ii.* *ඇතැම් ආනයන සීමා කිරීම සඳහා පනවා ඇති ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාමාර්ග විදේශ විනිමය ද්‍රවශීලතාවය සහ මුදල් තත්ත්වයන් අනුව තක්සේරු කරනු ලැබේ.*

ශ්‍රී ලංකාව තිරසාර පදනමක් මත යථා තත්ත්වයට පත් වීම වේගවත් කිරීම සඳහා මහ බැංකුව සහ රජය යන දෙඅංශය විසින්ම හඳුනාගෙන ඇති කෙටි කාලීන ස්ථායීකරණ ක්‍රියාමාර්ග සහ මැදි හා දිගු කාලීන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, අර්බුදයක් පවතින අවස්ථාවකදී සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ නැවත යථා තත්ත්වයට පත් කිරීමේ උපක්‍රම සැකසීම අවිනිශ්චිතතා රාශියක් මධ්‍යයේ සිදු කළ යුතු වේ. ඉදිරියේදී ලැබෙන නව තොරතුරු සමග ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සඳහා කාලෝචිත ගැළපීම් සිදු කිරීම අවශ්‍ය වනු ඇත.

**අවශ්‍ය පරිදි ප්‍රතිපත්ති සහ නියාමන ක්‍රියාමාර්ග ගැනීම තුළින් සිය අරමුණු සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව ඉදිරියටත් කැපවී සිටින අතර, ඉදිරි ප්‍රවණතා සමීපව නිරීක්ෂණය කරමින් නිවැරදි කිරීමේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග නිසි පරිදි ක්‍රියාත්මක කරනු ඇත. ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ඉතිහාසය තුළ තීරණාත්මක අවස්ථාවක් වන මෙම මොහොතේ මූල්‍ය අංශයේ සහභාගිවන්නන්ගේ, ව්‍යාපාරික ප්‍රජාවේ සහ මහජනතාවගේ නොසැලෙන සහයෝගය, සහයෝගීතාව සහ කැපවීම මහ බැංකුව අගය කරන අතරම, සාමූහික ප්‍රයත්න තුළින් අර්බුදය ජය ගන්නා තෙක් ඒ පිළිබඳව අවධානයෙන් සිටීම සඳහා වන ස්ථිර කැපවීමේ අවශ්‍යතාව ශ්‍රී ලංකා මහ බැංකුව නැවත අවධාරණය කරයි.**